# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 12 දරන ජූරි සභා නඩු විභාග (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 12 දරන ජූරි සහා නඩු විභාග
(විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

එල්.ඩී.—ඕ. 65/72.

**අපරාධ නඩු විධාන සංග්‍රහයේ XX වන පරිච්ඡේදය යටතේ පැවැත්වෙන නඩු විභාගවල ඇතැම් නීතිඥාතිවල දී ඉංග්‍රිසියට භාෂණ පරිවර්තනය කිරීම අත්හැරීම පිණිස විශේෂ විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 12 දරන ජූරි සභා නඩු විභාග (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. අපරාධ නඩු විධාන සංග්‍රහයේ XX වන පරිච්ඡේදය යටතේ වූ යම් නඩු විභාගයක දී— පනතේ විෂය පථය.

(අ) එම නඩුවේ නීතිඥානය ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ කරනු ලබන විටක දී, සහ

(ආ) ජූරි සභාව ඉංග්‍රිසි භාෂාව කථා කරන ජූරි සභික මණ්ඩල යෙන් තෝරා ගනු ලැබූ විටක දී

මෙම පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

3. මෙම පනතේ විධිවිධාන අදාළ වන නඩුවක් විභාග කරන විනිශ්චයකාරවරයා විසින්, ඔහු අවශ්‍ය යයි අදහස් කරන විමසීම් වලින් පසු, සෑම ජූරි සභිකයකුට ම අවස්ථාවෝචිත පරිදි සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඇතැයි සලකනු ලැබුවහොත්-— විනිශ්චයකාරවරයකුගේ අභිමතය.

(1) අවස්ථාවෝචිත පරිදි සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ දෙන ලද යම් සාක්ෂියක්,

(2) විනිශ්චයකාරවරයා විසින් හෝ යම් උත්තරවාදියකු විසින් හෝ අවස්ථාවෝචිත පරිදි සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ කරන ලද යම් දේශනයක්, සහ

(3) සිංහල හෝ දෙමළ නො වන භාෂාවකින් දෙන ලද යම් සාක්ෂියක් අවස්ථාවෝචිත පරිදි සිංහලට හෝ දෙමළට භාෂණ පරිවර්තනය කරනු ලැබුවහොත් ඒ සාක්ෂි

ඉංග්‍රිසියට භාෂණ පරිවර්තනයක් නො කොට නඩු විභාගය පවත්වා ගෙන යන ලෙස ඒ විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

4. මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල ව පවත්වනු ලැබූ නඩු විභාගයක්, පටහැනි යම් නීතියක විධිවිධාන හෝ යම් පූර්ව නිදර්ශනයක් හෝ නො තකා, නීත්‍යනුකූල ව පවත් වනු ලැබූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. 3 වන වගන්තියට අනුකූලව පවත්වනු ලැබූ නඩු විභාගයක් නීත්‍යනුකූල බව.

5. මෙම පනත 1972 මැයි මස 22 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. මෙම පනත අතීතයට බලපාන බව.

කේ 17513—9,114 (72/10)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද, පනත් කෙටුම්පත් සහ නීති නොයැවසීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.